# හිතුවක්කාර ගිරා පැටියා



පසන්දී තරුල්යා සෝමරත්න

# හිතුවක්කාර ගිරා පැටියා

පසන්දී තරුල්යා සෝමරත්න

කතෘගේ වෙනත් කෘති : දඟම දඟයාට යස පාඩම

කෘතිය පළ කරන දින : 2025 පෙබරවාරි 08

ISBN978-624-208-288-2

## පිදුම

දෛවයට පෙර හුරු ගැන්වූ
දහමින් මුල් පිටු රසවත් කළ
දැනුමෙන් මගේ ලොව එළිය කළ
ආදරණීය සිසිරා චන්ද්‍රලතා ගුරු මැණියන්ටත්
ගයත්‍රි සෙනෙවිරත්න ගුරු මැණියන්ටත්
ආදර ගෞරවයෙන් පුද කරමි!

# පෙරවදන


සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **“හෙරණගත්කරණි”** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,
ශශිකලා සේනාධීර,
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

පුංචි ලස්සන කැළෑවක ලොකු ගස් බෙනයක
ගිරා පවුලක් ජීවත් වුණා.



ගිරා අම්මා යි, තාත්තා යි, දුවයි, පුතා යි හරි ම සතුටින් මේ කැළෑවේ හිටියා.



“ළමයිනේ ඔය දෙන්නා කැළෑවේ මැද්දට යන්න එපා, එහෙ නපුරු සත්තු, කුරුල්ලෝ ඉන්නවා.” ගිරා අම්මා යි, තාත්තා යි කිව්වා.



ගිරා දුවයි, පුතා යි ගේ ළඟ ම සෙල්ලම් කරා. එක දවසක් ගිරා පුතාට කැලේ මැද්දට ගිහින් බලන්න ආසා හිතුණා.



“අක්කේ, අපි කැලේ මැද්දට ගිහින් බලලා එමු ද?” ගිරා මල්ලී ඇහුවා. “එපා, එපා මල්ලී ඒ පැත්තට යන්න එපා කියලනේ තියෙන්නේ. අපි හැංගිමුත්තන් කරමු. ඔයා හැංගෙන්න. මම හොයන්නම්” ගිරා අක්කා කිව්වා.



ගිරා මල්ලී හැංගෙන්න හිතාගෙන කැලේ මැද්දට පියාඹගෙන ගියා."හරිම ලස්සනයි.මල්, පලතුරු ගොඩක් තියෙනවා"කියලා හිතමින් කැලේ මැද්දට ම ගියා.



ගිරා පුතා දිහා උකුස්සෙක් බලාගෙන ඉන්නවා දැකලා ගිරා පුතා හොඳට ම බය වුණා. “ අම්මේ....,අම්මේ...... මාව බේරගන්න”. කියලා ගෙදරට ඉගිළිලා ආවා.



“මොකද පුතේ වුණේ” ගිරා අම්මා ඇහුවා. ගිරා පුතා වෙච්ච දේ කිව්වා. “ඒකනේ පුතේ එහෙට යන්න එපා කිව්වේ” ගිරා අම්මා කිව්වා.



“මට සමාවෙන්න අම්මේ ආය මම කවදාවත් එහෙට යන්නේ නෑ. අම්මා කියන දේ අහන හොඳ ළමයෙක් වෙනවා”. ගිරා පුතා කිව්වා.



ඒ දවසේ ඉදන් ගිරා අම්මා යි, තාත්තා යි, දුවයි, පුතායි සතුටින් මේ පුංචි කැලේ ජීවත් වුණා.



# පසුවදන



රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමුලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දි තිබේ. තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්